රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:09/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 පෙබරවාරි මස 16 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්,
රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාරයන්හි
නිසි බලධාරීන්, රජයට පවරාගත් සමාගම්වල
සභාපතිවරුන් වෙත.

# රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිසංවිධානය කිරීම.

01. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අංශය.

(අ) මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය නියෝජ්‍යත්ව හා පරිපාලන ප්‍රතිසංස්කරණයන්හි සංවිධානාත්මක සංවර්ධනය යන කරුණුවල ප්‍රතිපත්ති ලක්ෂණයන් පිළිබඳව කටයුතු කිරීම සඳහා ආඥාත්මක යොමුකිරීමක දැඩි අවශ්‍යතාවය පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවට පෙනී ගියේය. මෙය අරමුණු කොට ගනිමින්, රාජ්‍ය පරිපාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ යොමු ලක්ෂය සේ ප්‍රතිපත්ති අංශය ස්ථාපිත කිරීමට රජය තීරණය කරන ලදී.

(ආ ) ප්‍රතිපත්ති අංශයේ කාර්යය වනුයේ රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණය සහ සංවිධාත්මක සංවර්ධනය පිළිබඳ පොදු ගැටළු හඳුනාගැනීම සහ ඒවා විසඳීමෙහි නියුතුවීම ය. පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවේ වාර්තා ක්‍රියාත්මක කිරීම,සමීක්ෂණය කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පළාත් සභා වෙත පැවරෙන ප්‍රතිපත්ති හා වැඩ සටහන් සඳහා සහාය දීමට සහතික වීමත්, එයට පැවරෙන ප්‍රධාන කාර්යය වශයෙන් දැක්විය හැකිය. පිරිස් කළමනාකරණයට සම්බන්ධ ප්‍රතිපත්ති හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, විගණන හා සේවක සංඛ්‍යා සමාලෝචනය සංවිධානය කිරීම, පරිපාලන ක්‍රම වැඩිදියුණු කිරීම සහ පුහුණුව හා රැකියා දියුණු කිරීම පිළිබඳ ක්‍රමානුකූලව සකස් කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් ද මෙම අංශය වගකිවයුතු වේ. එය ඒකක 04 කින් සමන්විත වන අතර, ඇමුණුමෙහි එම විස්තර දන්වා ඇත.

01. **රාජ්‍ය සේවා පුහුණු ආයතනය:-**

පළාත් රාජ්‍ය සේවය තුළ කළමනාකරණ නිපුණතාවන් ඇති කිරීමෙහි ලා ඇඩි වෙහෙසක් දැරීමට පැවරීම් කාර්යයට සිදුවන බව ද රජයට පෙනී ගියේය. කළමනාකරණ සේවක සංඛ්‍යාවට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් පුහුණුව ලැබෙන අතර, අංශ මට්ටම දක්වා කළමණාකාර නොවන සේවක සංඛ්‍යා අවශ්‍යතා සපුරාලීම නව ආයතනයක් වන රාජ්‍ය සේවා පුහුණු ආයතනයෙන් ඉටු කෙරෙනු ඇත. රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ කුඩා මධ්‍යස්ථානයක් කොළඹ පිහිටුවෙන අතර, පළාත් හා කොට්ඨාශ මට්ටමෙන් කළමනාකරණ ක්‍රම හා පුහුණු කිරීම් කටයුතු කිරීම සඳහා විමධ්‍යගත පළාත් මධ්‍යස්ථාන කාණ්ඩයන් පිහිටුවීමට වගබලා ගනු ඇත.

02. **ග්‍රාමීය සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය:-**

ග්‍රාමීය සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය, වර්තමානයේ එයට ඇති ගම් මට්ටමේ කම්කරුවන් පුහුණු කිරීම හා රජයේ නොවන ආයතන ගම් මට්ටමෙන් ශක්තිමත් කිරීමට අමතර වශයෙන් උප කොට්ඨාශ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල පුහුණු කිරීමෙන් වඩාත් පුළුල් කෙරෙනු ඇත. රාජ්‍ය සේවා පුහුණු ආයතනය හා ග්‍රාමීය සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය පොදු පහසුකම් පරිහරණයට ගනිමින් පළාත්වල සියළුම සේවක මට්ටම් සඳහා පුහුණු හා සංවර්ධන ඒකාබද්ධ රාමුවක් තුළ පිහිටා වැඩ කටයුතු කරනු ඇත.

04 අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අංශය, රාජ්‍ය සේවා පුහුණු ආයතනය හා ග්‍රාමීය සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනයට ඔබගේ කාර්යශීලි සහයෝගය අපේක්ෂා කෙරේ. මෙම ආයතනයන් ඔවුන්ගේ වැඩ සටහන් සම්බන්ධයෙන් ඉක්මණින්ම ඔබ හා සම්බන්ධකම් පවත්වනු ඇත.

අ.කලේ/(නීල් ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

## අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අංශය.

### (අ) පිරිස් ප්‍රතිපත්තිය සඳහා ඒකකය.

(1) වැටුප් සහ වන්දි ප්‍රතිපත්තිය, වැටුප් විෂමතා ගනුදෙනු.

(ii) බඳවා ගැනීමේ ප්‍රමිති හා පරිපාටි.

(iii) උසස් කිරීම, සේවයේ යෙදවීම සහ මාරුකිරීමේ ප්‍රතිපත්තිය.

(iv) සේවක සම්බන්ධතාවය ආත්ම ධෛර්ය.

(v) වෘද්ධෝපගත හා විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තිය.

(vi) ආයතන සංග්‍රහය.

### (ආ) විගණන හා සේවක සංඛ්‍යා සමාලෝචන සංවිධානය සඳහා ඒකකය.

(i) විගණන පිළිබඳ සංවිධානාත්මක කාර්යක්ෂම බව හා සඵලතා තත්වය.

(ii) සේවක සංඛ්‍යා සමාලෝචන තත්ත්වය

(iii) සේවක සංඛ්‍යා වැඩිකිරීම සඳහා ඉල්ලීම් අගැයුම.

(iv) රැකියා වර්ගීකරණය.

(v) රාජ්‍ය සේවය සඳහා මිනිස්බලය සැළසුම් කිරීම.

### (අං) පරිපාලන ක්‍රම සඳහා ඒකකය.

(i) පරිපාලන ක්‍රම, ව්‍යුහ සහ පරිපාටි සමාලෝචනය හා නවීකරණය කිරීම.

(ii) මූල්‍ය කළමනාකරණ ක්‍රම වැඩිදියුණු කිරීම.

(iii) කාර්යල ක්‍රම හා විධි සහ පොදු කාර්ය සංවිධානය සමාලෝචනය හා නවීකරණය කිරීම.

(iv) කළමනාකරණ තොරතුරු ක්‍රම හා කාර්යාලීය ස්වයංකරණය සමාලෝචනය හා වැඩිදියුණු කිරීම.

### (ඇ) පුහුණු හා රැකියා සංවර්ධන සඳහා ඒකකය.

(i) පුහුණු හා රැකියා සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රමානුකූලව සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, සමීක්ෂණය හා අගැයුම.

(ii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමට සහ එකී අවශ්‍යතාවයන්" සපුරා ගැනීමට අවශ්‍ය පුහුණු සැලසුම් සකස් කර ගැනීමට සහාය වීම.

(iii) පවතින පරතරයන් නැති කිරීම සඳහා පුහුණු ආයතන හා පුහුණු වැඩසටහන් සමාප්ත කිරීම

(iv) පුහුණු ආයතන හා එහි වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම, සමීක්ෂණය හා අගැයුම.

(v) පිටරට වැඩ සටහන් (කාර්මික නොවන) සැළසුම් කිරීම හා ඇති කිරීම.